සන්නස සාහිත්‍ය තරගාවලිය 2006

නිර්මාණ බාරගන්නා අවසාන දිනය 2006 පෙබරවාරි 28

ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ප්‍රජාව අතර සිංහල සාහිත්‍යය පිළිබඳව ඇතිව තිබෙන පිබිදීම ආශ්වාදජනකය. මේ මොහොතේ දී මෙරට සිට සිංහලෙන් ලියන ලේඛක ලේඛිකාවන් දිරිමත් කිරීම සිය වගකීමක් ලෙස සන්නස සලකයි. සන්නස වාර්ෂික සාහිත්‍ය තරග මාලාව ඇරඹෙන්නේ ඒ සිතිවිල්ල නිසා ය.
තරග මාලාව කෙටිකතා සහ කාව්‍ය වශයෙන් දෙකොටසකින් යුක්ත වෙයි. සහභාගිවන විවිධ වයස් කාණ්ඩ වලට අයත් ලේඛක ලේඛිකාවනට අසාධාරණයක් නොවන සේ විවෘත හා කණිෂ්ඨ වශයෙන් අංශ දෙකක් යටතේ තරග පැවැත්වෙයි.

විවෘත අංශය
වයස් සීමාවකින් තොරව ඕනෑම ශ්‍රී ලාංකිකයෙකුට විවෘත අංශයට සහභාගි විය හැකි ය.

කණිෂ්ඨ අංශය
වයස අවුරුදු 18 ට අඩු තරගකරු-වනට/තරග කාරියනට මේ අංශය වෙන් වෙයි.

කෙටි කතා (විවෘත/කණිෂ්ඨ) පොදු කොන්දේසි
1 කෙටි කතා සඳහා වචන සීමාවක් නැත.
2 තමන්ට කැමති තේමාවක් යටතේ නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
3 එක් අයෙකුට තමන් කැමති නිර්මාණ සංඛ්‍යාවක් හැකි ය.
4 කෙටිකතාව තමාගේම නිර්මාණයක් බවත් තරග කොන්දේසි වලට එකඟ වන බවත් සඳහන් ලිපියක් සෑම නිර්මාණයක් සමග එවිය යුතුය.

කාව්‍ය නිර්මාණ (විවෘත/කණිෂ්ඨ) පොදු කොන්දේසි
1 වචන සීමාවක් නැත
2 තමන්ගේ අභිමතය පරිදි සඳැස් හෝ නිසඳැස් නිර්මාණ ඉදිරිපත් කළ හැකි ය.
3 එක් අයෙකුට තමන් කැමති සංඛ්‍යාවක් නිර්මාණ ඉදිරිපත් කිරීමට අවසර ඇත.
4 නිර්මාණය තමන්ගේම බවත් තරග කොන්දේසි වලට එකඟ වන බවත් සඳහන් ලිපියක් සෑම නිර්මාණයක් සමගම එවිය යුතුය.

සියළුම අංශ සඳහා පොදු කොන්දේසි

1 සෑම නිර්මාණයක්ම **පිටපත් තුනකින්** යුතුව එවිය යුතු ය.
2 තරගයට ඉදිරිපත් කරන නිර්මාණ මෙයට පෙර ප්‍රකාශිත ඒවා නොවිය යුතු ය.
3 තරගයට එවන නිර්මාණ නැවත ආපසු එවීමට හැකියාවක් නැති බව සළකන්න.
4 නිර්මාණ බාරගන්නා අවසාන දිනය **2006 පෙබරවාරි 28** වෙයි.
5 තරගය පිළිබඳ මතුවන ගැටළු වලදී සන්නස සංස්කාරකගේ තීරණය අවසන් තීරණය බව සළකන්න.

සන්නස වාර්ෂික සාහිත්‍ය තරගය 2006
Sannasa
PO Box 172 Reservoir
Vic 3073 Australia

හැම දේශපාලනඥයාම බොරු කියනවා
කතාව විතරයි වැඩ නෑ
ආදිවාසී නායක ඌරුවරීගේ
වන්නියලැත්තෝ කියයි
ලක්ඛිම
වන්නියලෑ ඇත්තන්ට ඒක තේරුම් ගන්ඩ ගිය කාලයක්

මහින්ද කකුල් දෙකෙන් සිටුවා ඉදිරියට
ගෙනාවේ මගේ අක්කා මා ඔහුගේ
කකුලෙන් අදින්නේ කුමටදැයි අනුර අසයි
ලංකාදීප
අක්කයි මල්ලියි දෙන්නම පක්ෂෙන් ගිය වෙලාවෙත් පක්ෂයටම වෙලා හිටියෙ මහින්ද නේද?

ව්ජය රජතුමා පැමිණි දවසේ සිටම
කාන්තාව රැවටුණා ජනාධිපතිවරණ
යෙන් පසුව වත් මේ රටේ කාන්තාව
රැවටීම නවතියි කියා සිතනවා
-නීතිඥ ශාමිලා දළුවත්ත
ලක්ඛිම
ඒ වගේම තමයි නෝනා ඒ කාලෙ ඉඳලම තාමත් පිරිමි ඇත්තෝ කෝච්චරවත් කාන්තාවන්ට රැවටෙනවා

මේ අවස්ථාවේ අප ජනතාවගේ හදවතේ
ගැස්ම හඳුනාගත් නායකයකු තෝරාගත
යුතුයි - සමස්ත ලංකා වෘත්තීය සමිති
සම්මේලනයේ ප්‍රධාන ලේකම්
ලක්ඛිම
හැමදාම අපි තෝරා ගන්නේ ජනතාවගෙ හදවතේ ගැස්ම හඳුනන නායකයො තමයි ඒත් වැඩේ කියන්නෙ දින්නට පස්සෙ ඒ අයට දැනෙන් හෙන්චයියන්ගෙ හදවතේ ගැස්ම විතරයි

එජාපය උතුර කොටින්ටවත් දකුණ
නරීන්ටවත් පාවා දෙන්නේ නැහැ
හේමකුමාර නානායක්කාර
දිවයින
දෙන්න දෙයක් නෑ මහත්තයා දැනුත් උතුරයි දකුනයි පාලනය කරන්නෙ ඒ දෙගොල්ල තමයි

නැන්දම්මයි ලේලියි
අතර ඇති වන
ගැටුම් එමටය. නමුත්
නැන්දම්මයි බෑණයි
අතර ගැටුම්
ඇතිවන්නේ නැත.
පහු පහු වෙන විට
කොහු කොහු වෙනවා
සේ කල් ගත වන විට නැන්දම්මාට
බෑණාගේ අගේ නැති වෙයි. ඒ ඉව
අන්දරේ කවියෙන් කීවේ මෙසේ ය.

අලුත් පිට බෑණා ලෙදර එන කොට
මලුත් පුදා දුව කැඳවා දෙයි ළඟට
කලක් ගොසින් බෑණෘ පරණ වෙන කොට
බලුත් නොවටිය බෑණා නැන්දා ට

පිදිය යුතුමය

හෙන්රි ජයසේන ශූරීන් ආචාර්ය උපාධියකින් පුද ලද පුවත අපේ හිතට ඇතුල් කළේ ලොකු සතුටත්. බොහෝ ඇසූ පිරූ තැන් ඇති එතුමා අපේ සිංහල නාට්‍ය කලාවට පමණක් නෙවෙයි සාහිත්‍යයටත් කළ සේවාව අමතක කරන්නෙ කොහොමද? එවන් උතුමකුට කෘතවේදීත්වය පළකිරීම ජාතියේ යුතුකමක්. පමා වී හෝ ඒ යුතුකම කළ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට අපේ ස්තුතිය හිමිවෙනවා.

ඒ එක්කම නව කවි පරපුරේ මුදුන් මල්කඩ වන් රත්න ශ්‍රී විජේසිංහ ශූරීන් නැවත රැකියාවේ පිහිටුවන ලෙස ලැබුණ අධිකරණ නියෝගයත් අපට සතුටක්. පසුගිය කාලයේ රැකියා විරහිතව එතුමා වින්ද දුක් කම්කටොලු අපි හොඳින්ම දන්නවා. ජාතියේ රැකවරණය ලැබිය යුතු රත්න ශ්‍රී වැනි කලාකරුවනට සිය අයිතිවාසිකම් ඉල්ලා සටන් කරන්නට සිදුවීම මොන තරම් අභාග්‍යයක්ද? රත්න ශ්‍රී කවියා සුමාන දෙකකට කළින් අනුමෝදනාව මැයෙන් ලක්ඛිම පත්තරේට ලියලා තිබුණ මේ කවිය දිග කතාවක් කියනවා.

අනුමෝදනාව

ඉසිඹු ලැබ නික්ම යම්
දෙපයින් ම
පුරුදු පා ගමනින් ම

මග වැටී සිටිය දී මා
අසුලා ගත්තෙහිය ඔබ

හරන්තික මෙන් උර දැරූ
දුගඳ කුණපය මුදවා
මුගුරින් පහළ තැන් තවා
හද පිරිමැද පණ පොවා
උවටැන් කළෝ ඔබ ය.

අන්න පානාදියෙන්
මුදලින් හදලින්
අස්වසන වදනකින්
මා රැකියෝ ඔබය

කැමැත්තක් කරනු මැන ඉතින
අසුලා ගත් දෙයට

නොදන්නෙමි
පින් දෙන ගාථා
අනුමෝදනා කථා
ප්‍රශංසා

යහපතක්ම වේවා
ඔබට ද
ඔබෙන් ලොවටද

රත්න ශ්‍රී විජේසිංහ

සිංහල, දෙමළ, ඉංග්‍රීසි

පහුගිය දාක යාළුවෙකුගෙ ගෙදරකදී දෙමළ මහත්තයෙක් හමුවුණා. අවුරුදු තිහකට කළින් මෙල්බන් වලට ආව. පුදුමෙ කියන්නේ ඔහු ඉතාම හොඳට සිංහල කතා කරනවා.

තාමත් සිංහල මතකයි නේද..? අපි ඇහුවා.

මට නම් තාම සිංහල මතකයි... ඒත් සමහර සිංහල මිනිස්සු එක්ක මං සිංහලෙන් කතා කළාම ඒ අය මා එක්ක ඉංග්‍රීසියෙන් කතා කරනවා.. ඔහු කිව්වෙ හිනා වෙමින්.

පාරෙන් අහුලන් ආ රේඩියෝ කාරයා.

මේ සටහන තරමක් දිග එකක් වේවි. ඒත් මං ඒක ලියනවා.

කුමාරගමගේ භාතිය මංජුල වික්‍රමසිංහ කියන තරුණයා මෙයට අවුරුදු දෙකකට විතර කළින් මට මුණ ගැසුණේ අහම්බෙන්. ඔහු ඒ දිනවල තමන්ගෙ කළමනාකරණ ප්‍රථම උපාධිය සම්පූර්ණ කරමින් හිටියෙ. කතා කළ මුල් දවසෙදිම අනෙක් බොහෝ නූතන තරුණයන් තුළ දකින්නට නැ.ති විශේෂත්වයක් මම ඔහු කෙරෙන් දැක්කා. අනෙක් බොහෝ තරුණයන්ට නැති තරමේ සමාජය පිළිබඳ දැක්මක් ඔහුට තිබුණා. තමන්ගේ රට පිළිබඳව රටේ ඉතිහාසය, මිනිස්සු පිළිබඳ ඔහුට තිබුණෙ හොඳ දැනීමක්. මං ඔහුට පහන ට ලියන්න ආරාධනා කළා. ඔහු ඒ අනුව කටු සටහන් නම් වන තීරු ලිපිය ලිව්වා.

මේ අතරේ මෙල්බන් රෑ ගුවන් විදුලියට නිවේදකයන් අවශ්‍ය බව මට දැනගන්න ලැබුණා.

මල්ලි කැමතිද රේඩියෝ එකකට..? මං ඇහුවා.

භාතිය එක පයින් කැමති වුණා.

ඔහු තමන් කරමින් හිටිය රෑ වැඩ මුරය පවා අමතක කරගෙන රෑ රේඩියෝවට ගියා. බොහොම ඉක්මනින් ඔහු ගුවන් විදුලියේ මෙහෙයුම් පැනලය ඉගෙන ගත්තා. (ගරු මුෂ්ඨි තබා නොගෙන ඔහුට ඉගැන්වූ නිමල් ට ස්තුතියි) ඒ කාලෙ මං කළේ රෑ රස්සාවක්. වැඩ කරන ගමන් ගුවන් විදුලිය අහන්න නිදහස තිබුණා. රෑ වැඩ සටහන ඉවර කරලා ගෙදර යන ගමන් භාතිය හැමදාම මට දුරකථන ඇමතුමක් දෙනවා.
අයියේ අද කොහොමද ප්‍රෝග්‍රෑම් එක... ? මගේ අඩුපාඩු මොනවද..? ඔහු අහනවා.

මං අවංකවම ඔහුගෙ වැඩ සටහනේ ගුණ දොස් පෙන්වා දෙනවා. අඩුපාඩු පිළිගන්න ඔහු කැමතියි. ඒ වගේම ඔහු ඊළඟ දවසේ ඒ අවුපාඩු නිවැරදි කරගන්නා අකාරයත් මම දැක්කා. (කෙනෙක් අවංකව අඩුපාඩු පෙන්වා දුන්නාම ඒවා පිළිගන්නෙ හැදෙන මිනිස්සු.) ඔහු ඉක්මනින් ඉදිරියට යන හැටි බලා අපි සතුටු වුණා.
මාසයකට විතර පස්සෙ දවසක ඔහු මා හමුවෙන්න ආවෙ ඉතාම කණස්සලු මුහුණින්.

මොකද ප්‍රශ්ණෙ..? මං ඇහුවා.

මං හරි කළකිරිලා ඉන්නෙ අයියෙ... ඔහු කිව්වා. ඇයි..?

මං රේඩියෝ කරනවට සමහරු කැමති නැහැ වගේ... ..... (මෙල්බන් ගුවන් විදුලි ශිල්පියෙකුගේ නමක්) කියල තියෙනවනේ පාරෙ ඉඳන් ගොඩවුණ අයත් දැන් රේඩියෝ කරන්න පටන් අරන් කියලා.. ඔහු කිව්වා. ... එයා රේඩියෝ කරන හැටි ගිය ආත්මෙ ඉඳන් ඉගෙන ගෙන ඇවිත් වගේනෙ කතා කරන්නෙ...

ඕවා ගණන් ගන්න එපා මල්ලි... මං කිව්වා. .. දැන් මුල මතක නැති වුණාට ඔය හැමෝම ඔයා වගේම බින්දුවෙන් පටන් ගත්ත අය තමයි. ඔය බහුබූත කතා හිතට ගන්නෙ නැතිව තමන්ගෙ වැඩේ කරගෙන යන්න...

එයින් මාස කීපයකට පස්සේ භාතිය ආපහු ලංකාවට ගියා. එයින් පස්සේ වැඩිය තොරතුරු දැනගන්න ලැබුණෙ නැහැ. ඒත් මට පහනෙන් අයින් වෙන්න වුණ බව දැනගත් ගමන් ඔහු ඉතාම හැඟීම් බර ඊමේලයක් එව්වා. අයියේ අපි උඹත් එක්ක ඉන්නවා.. මං වගේම උඹට ආදරය කරන මිනිස්සු ගොඩක් ඉන්න බව අමතක කරන්න එපා .. හිතට ධෛර්යය ගනින්.. ඔහු ලියලා එව්වා.

එයින් මාස ගණනකට පස්සෙ මේ සටහන ලියන අද ඔහු මට දිග ඊමේලයක් එවලා තිබුණා. ඇසට කඳුලක් නංවන හෘදයාංගම බවකින් ලියලා තිබුණ ඒ ඊමේලයේ වැදගත්ම කාරණය මේකයි.

ලංකාවෙ අලුතෙන්ම ආරම්භ කරන නෙත් ගුවන් විදුලි සේවාවේ වැඩ සටහන් සම්පාදකයෙකු හා නිවේදකයෙකු ලෙස මාව තෝරාගෙන තියෙනවා. ඒ වෙනුවෙන් අපි මාස හයක් විතර පුහුණු වුණා... අපේ රේඩියෝව නොවැම්බර් 3 වෙනිදා මංගල වැඩ සටහන ප්‍රචාරය කරනවා... අපේ අරමුණ ශ්‍රී ලාංකි කයනට හරවත් ගුවන් විදුලියක් ලබාදීම... මට හරිම සතුටුයි.. මොකද මං ඉතින් මෙල්බන් රේඩියෝ එකේ අහවල් එක්කෙනා කිව්ව විදිහට පාරෙ ඉඳන් රේඩියෝ එකට ගොඩ වෙලා නිවේදකයෙක් වෙච්ච මනුස්සයෙක්නෙ..

ඒක හරි මල්ලි.. මුල අමතක කරගන්නෙ නැතිව ඔලුව උදුම්මා ගන්නෙ නැතිව හිටියොත් වරදින්නෙ නැහැ...